# ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය

# 2023 වාර්ෂික සැලැස්ම

# ප්‍රගතිය

## හපුතලේ ප්‍රාදේශීය සභාව











| | | |
|---|---|---|
| පළාත් පාලන ආයතනයේ නම | :- | හපුතලේ ප්‍රාදේශීය සභාව |
| ලිපිනය | :- | හපුතලේ ප්‍රාදේශීය සභාව දියතලාව |
| විද්‍යුත් තැපැල | :- | hapuprasa@yahoo.com<br>pradeshiyasabhahaputhale@gmail.com |
| දුරකථන අංකය | :- | 057-2229075 |
| ෆැක්ස් අංකය | :- | 057-2229075 |

## <u>01. හැඳින්වීම</u>

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය ප්‍රාදේශීය සභාව සතු කාර්යයන් අතරින් ප්‍රමුඛ කාර්යයක් ලෙස සැලකේ. කාලීනව මතු වන ඩෙංගු වැනි වසංගත රෝග මර්ධනයේ දී ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය වැදගත් ස්ථානයක් ගනී.

හපුතලේ ප්‍රාදේශීය සභාව 2014-07-01 දින සිට කසළ ජනනය වන ස්ථානයේ දී වෙන්කර එක් රැස් කිරීම ආරම්භ කරන ලද අතර මේ වන විට 95% ක් කසළ වෙන් කර එක් රැස් කිරීම සිදු කරනු ලබයි.

එම වෙන් කරන ලද කසළ අතරින් දිරාපත් වන කසළ කොම්පෝස්ට් කරණය සඳහා යොමු වන අතර දිරාපත් නොවන කසළ ප්‍රතිචක්‍රිකරණය සඳහා යොමු කරනු ලබයි.

මෙම ක්‍රියාකාරි සැලැස්ම තුළින් නවීන කසළ කළමනාකරණ තාක්ෂණික ක්‍රම කරා යොමු වීමටත් කසළ කළමනාකරණය තව දුරටත් විධිමත් කිරීමටත් බලාපොරොත්තු වන අතර සුපිරිසිදු බල ප්‍රදේශයක් බිහි කිරීමට පළාත් පාලන ආයතන යොමු වීම මේ තුළින් සාර්ථක කර ගැනීමට ලැබේ.

## 02. අරමුණු

සුවිශේෂි අරමුණු :- විධිමත් සැලසුම් සහිත කසළ කළමනාකරණය තුළින් බල ප්‍රදේශයේ සුපිරිසිදු බව රැකගැනීම හා පරිසර දූෂණය වළක්වාලමින් තිරසාර පාරිසරික සංවර්ධනයක් ඇති කිරීම.

වෙනත් අරමුණු :-

- පාරිසරික දූෂණය වැළැක්වීම.
- ජනතාව විධිමත් කසළ කළමනාකරණයකට යොමු කිරීම.
- කාබනික පොහොර නිෂ්පාදනය හා අලෙවිය වැඩි කිරීම.
- නොදිරණ කසළ විධිමත් පරිදි මිලදි ගන්නන් හට අලෙවි කිරීමේ ක්‍රමවේදයන් දියුණු කිරීම.
- අවසන් අපහරණ කසළ පරිසර දූෂණය අවම වන අයුරින් අපහරණය සඳහා යොමු වීම.
- කසළ අවසන් අපහරණය භූමිය පුළුල් කරවා ගැනීම හා නව ඉඩමක් වෙන්කරවා ගැනීම.
- කසළ සඳහා වටිනාකම් එකතු කිරීම
- මිල දී ගන්නන් සමග ජාලගත වී කසළ කළමනාකරණ ක්‍රියාවලිය සිදු කිරීම සහ විවෘත භූමියට බැහැරලීම අවම කිරීම

**03.** වර්තමාන ක්‍රියාත්මක වැඩසටහන

| | | | |
|---|---|---|---|
| කසළ එක්රැස් කරනු ලබන ඒකක සංඛ්‍යාව | :- | ඒකක | **750** |
| දිනකට එක් රැස් කරනු ලබන කසළ ප්‍රමාණය | :- | ටොන් | **2.5** |
| භෞතික සම්පත් ප්‍රමාණය | :- | ට්‍රැක්ටර් රථ | **04** |
| | | කසළ කරත්ත | **02** |
| | | බොබ්කැට් යන්ත්‍ර | **01** |
| | | හලර් යන්ත්‍ර | **02** |
| | | කම්පැක්ටර් | **01** |
| | | බැකෝ යන්ත්‍ර | **01** |
| | | මිනි එක්සැකැවේටර් යන්ත්‍ර | **01** |
| | | රෝලර් යන්ත්‍ර | **01** |
| | | ගලි බවුසර් | **01** |
| | | ජල බවුසර් | **01** |
| | | බේල් යන්ත්‍ර | **01** |
| සේවා මුර සංඛ්‍යාව | :- | **01** | |
| | | පෙ:ව: **7.00** සිට ප:ව: **3.00** දක්වා | |
| කසළ එක්රැස් කරනු ලබන ආකාරය | :- | දිරාපත් වන හා දිරාපත් නොවන ලෙස කසළ ජනනය වන ස්ථානයේ දීම වෙන්කර එක්රැස් කිරීම සිදු වේ. | |

# වාර්ෂික සැලැස්ම - 2023

## සණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය

| අ:අ | ක්‍රියාකාරකම | ඉලක්කය | ක්‍රමවේදය | මාසය | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01 | කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය<br>සණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ මල් වර්ග ව්‍යාප්ත කිරීම( බුද්ධමල්, කපුරු, කැනාස් මල්) | අලංකාර පරිසරයක් තුළින් සේවය කිරීමට සුදුසු පරිසරයක් ඇති කිරීම | සේවකයින් ලවා පැල සිටුවීම සහ නඩත්තු කිරීම | වර්ෂය පුරා | 100% |
| 02 | වර්ෂය පුරා කොම්පොස්ට් පොහොර අලෙවිය ප්‍රවර්ධනය කිරීම සහ ආදායම් උප්පාදන වැඩසටහන් ආරම්භ කිරීම | සභාවේ ආදායම ඉහළ නැංවීම | දැන්වීම් අත්පත්‍රිකා සමාජ මාධ්‍ය භාවිතය තුළින් කසළ පිළිබඳව දැනුම පුළුල් කිරීම | වර්ෂය පුරා | 100% |
| 03 | සණ අපද්‍රව්‍ය කළමනාකණ මධ්‍යස්ථානයේ පළතුරු පැළ රෝපනය කිරීම සහ වර්ෂය පුරා නඩත්තුව සිදු කිරීම | අලංකාර පරිසරයක් තුළින් සේවය කිරීමට සුදුසු පරිසරයක් ඇති කිරීම | 2022 වර්ෂයේ රෝපනය කරන ලද පළතුරු පැළ ආරක්ෂා කර නඩත්තු කිරීම | වර්ෂය පුරා | 100% |
| 04 | ජීව අඟුරු මිශ්‍රිත<br>කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය | 2021 වර්ෂයේ හඳුන්වාදෙන ලද ජීව අඟුරු යොදා කොම්පොස්ට් පොහොරවල ගුණත්වය ඉහළ නැංවීම | උපකරණ සකසා ජීව අඟුරු නිෂ්පාදනය සහ කොම්පොස්ට් පොහොර නිෂ්පාදනයෙන් පසු ජීව අඟුරු 5% ක් මිශ්‍ර කිරීම | මාර්තු /ජුනි /සැප්තැම්බර් / දෙසැම්බර් | නිෂ්පාදන වාර 4 |
| 05 | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ආරක්ෂිත පැති බැම්ම දෙවන අදියර සිදු කිරීම | සීමිත ඉඩකඩ තුළින් උපරිම ප්‍රයෝජන ගැනීම | කොන්ත්‍රාත් | මාර්තු | ප්‍රතිපාදන අවශ්‍ය වේ |
| 06 | උසස් තත්වයේ කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය සහ අලෙවිය | සභාවේ ආදායම ඉහළ නැංවීම | කොම්පොස්ට් සඳහා ජීව අඟුරු ඒකතු කිරීම | වර්ෂය පුරා | 100% |
| 07 | සණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍යතා මිල දී ගැනීම | සේවක මහතුන්ට අවශ්‍ය උපකරණ ලබාදීම | ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර උපකරණ ලබාදීම | ජනවාරි /ජුනි | නව යන්ත්‍ර මිල දී ගැනීම |
| 08 | සියලුම පොලිතීන් බේලින් කිරීමට කටයුතු කිරීම | මිල දී ගන්නන් සඳහා අලෙවිය පහසු කිරීම | සියලුම පොලිතීන් වර්ගකර බේලින් කර අසුරා තැබීම | වර්ෂය පුරා | ප්‍රතිචක්‍රීකරණය සඳහා බදුල්ල නගර සභාවට යැවීම |
| 09 | කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ආදාර්ශ වගාභූමියක් පවත්වාගෙන යාම | සණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කොම්පොස්ට් පොහොර භාවිතරා කර වගාවන් සිදුකර ආදාර්ශයක් ලබාදීම | සේවකයින් ලවා බිම් සකස්කිරීම සිදුකර පැල සිටුවා නඩත්තු කිරීම | වර්ෂය පුරා | වගා වාර 2 |

| අ:අ | ක්‍රියාකාරකම | ඉලක්කය | ක්‍රමවේදය | මාසය | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 10 | සුපර් කොම්පෝස්ට් පොහොර සුපරීක්ෂණය කිරීම<br>මාලු ටොනික් සහ පලතුරු ටොනික් නිෂ්පාදනය කිරීම | නව නිෂ්පාදන පිළිබද අත්හදා බැලීම | රැගෙන ඒන පළතුරු සහ මාළු අපද්‍රව්‍ය ප්‍රමිතියට අනුව දියර පොහොර කිරීම | මැයි | කොම්පොස්ට් බෙඩ් සදහා මාළු දියර මිශ්‍ර කිරීම |
| 11 | කසළ ජනනය සහ නිවාසවල කසළ සංයුතිය තුළින් කසළ එකතුවීම පිළිබද සමීක්ෂණයක් සිදු කිරීම | ප්‍රදේශයේ දිරණ කසළ සහ නොදිරණ කසළ ජනනය පිළිබද අවබෝධයක් ලබාගැනීම සහ ඉදිරි සැලසුම් සකස් කිරීම | බල ප්‍රදේශයේ තෝරාගත් නිවාස කිහිපයක් පිළිබද සතියක අධ්‍යයනයක් සිදු කිරීම සහ කසළ වෙන වෙනම කිරා මැන ගණනය කිරීම | ජනවාරි | සමීක්ෂණය සිදු කර ප්‍රතිඵල මත දත්ත ලබා ගැනීම |
| 12 | කසළ එකතු කරන ස්ථාන සහ කසල ලබාදෙන ස්ථාන මෙන්ම පුද්ගලයන් ජාලගත කිරීම | කසළ එකතු කිරීම ක්‍රමවත් කිරීම | කසළ රථ සදහා GPS සහ CCTV කැමරා සවිකිරීම | ජුනි | සීසීටීවී සවිකර ඇත |
| 13 | කොම්පොස්ට් පොහොරවල ගුණත්වය මැනීම | කොම්පොස්ට්වල NPK අනුපාතය පිළිබද පරික්ෂා කිරීම | සාම්ප්‍රදායික කොම්පොස්ට් සහ සුපර් කොම්පොස්ට් සම්පල් ඌව විශ්ව විද්‍යාලය වෙත යැවීමට කටයුතු කිරීම | ජුලි | මමූලික කටයුතු සිදු කර ඇත |
| 14 | සෞඛ්‍ය සේවකයන් සදහා වෛද්‍ය සායන පැවැත්වීම | සේවක සුභසාධනය ඇති කිරීම | මූලික රෝහලට ලිපි මගින් දැනුවත්කර අවශ්‍ය සහයෝගය ලබාගැනීම | අගෝස්තු | සායන 1 |
| 15 | කොම්පොස්ට් අංගනයේ පැති බැමි සදහා පොලිතින් කුට්ටි යොදා අලංකාර කිරීම | ඉවතලන පොලිතීන් වලින් ඵලදායි ලෙස යොදා ගැනීම | පොලිතීන් බේල් කර අලංකාර පැතිබැම්මක් ඉදිකිරීම | සැප්තැම්බර් | වෙනත් විකල්ප සදහා යොමුකිරීම |
| 16 | කසළ පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන් සදහා ඍජුවම සම්බන්දවන ප්‍රජාව සහ ස්ථානවල වගකිවයුතු නිළධාරින් සමග විධිමත් කසළ කළමනාකරණය පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ජනතාව දැනුවත් කිරීම | ඝණ අපද්‍රව්‍ය සම්බන්ධ ප්‍රවීනයින්ගේ අදහස් මුහුණුපොත ඔස්සේ ලබාදීම | වසර පුරා | මුහුණු පොත ඇසුරින් ලබා දී ඇත |
| 17 | බල ප්‍රදේශයේ සෑම පාසලක්ම ආවරණය වන පරිදි කසළ පොල පැවැත්වීම | ග්‍රාමීය මට්ටමෙන් පවතින නොදිරණ කසළ ඉවත් කිරීම සහ මිල කිරීම, ඩෙංගු වැනි බෝවන රෝග වැලැක්වීම | විදුහල්පතිතුමා විෂය භාර ගුරුවරු පරිසර හය කන්ඩායම් සහ සිසුන් දැනුවත් කර මිලදී ගන්නන්ට සම්බන්ධකර දීම | මාර්තු / ජුනි / සැප්තැම්බර් /දෙසැම්බර් | කසල පොළ 2 ක් පවත්වා ඇත |
| 18 | දැන්වීම් පුවරු ස්ථාපිත කිරීම | අවිධිමත්ව අපද්‍රව්‍ය බැහැරලීව නැවතීම | අවිධිමත්ව කසළ බැහැර කරන ස්ථාන පරික්ෂාකර දැන්වීම් පුවරු ඉදිකිරීම හෝ පවතින දැන්වීම් පුවරු අලුත්වැඩියා කිරීම | ජනවාරි /ජුනි | ස්ථාන 5 බෝඩ් සවිකර ඇත |

| අ:අ | ක්‍රියාකාරකම | ඉලක්කය | ක්‍රමවේදය | මාසය | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 19 | සෞඛ්‍ය සේවකයින් සඳහා උපකරණ ලබාදීම | සෞඛ්‍ය ආරක්ෂිතව සේවය කිරීම | බූට්,ග්ලවුස් මාක්ස් වැසිකබා ලබාදීම | දෙසැම්බර් | ඉන්වෙන්ට්‍රිගතව ලබා දී ඇත |
| 20 | 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය සඳහා කසළ එක්රැස්වීම  අවම කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම | ග්‍රාමීය පරිසරයේ පොලිතීන් භාවිතය අවම කිරීම | නගරයට පැමිණෙන සියලුදෙනාට නිවසින් රෙදි බෑග් රැගෙන ඒන ලෙස වැඩසටහන් සංවිධානය කිරීම අත්පත්‍රිකා/ශබ්ද විකාශන / සමාජ මාධ්‍ය භාවිතා කිරීම | දෙසැම්බර් | සමාජ මාධ්‍ය තුලින් දැනුවත් කිරීම් කර ඇත |
| 21 | සෞඛ්‍ය සේවකයන්ගේ අභිමානය රැකෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | සේවක අභිප්‍රේරණය ඇති කිරීම | විනෝද වැඩසටහන්, චාරිකා, ක්‍රිඩා තරග/ ඇගයීමට ලක්කරන වැඩසටහන් | දෙසැම්බර් | වැඩසටහන් 2 |
| 22 | බල ප්‍රදේශයේ කසළ ලබාදෙන ප්‍රජාව ජාලගත කිරීම | කසළ රථ පැමිණීම සහ ඒ සම්බන්ධ වැදගත් තොරතුරු හුවමාරු කරගැනීඹ | කාල සටහන අනුව ගමන් මාර්ගයේ කසල ලබාදෙන්නන්ගේ whatsapp දුරකථන අංක යොදාගෙන සමූහයක් සැකසීම | මැයි | මූලික කටයුතු සිදු කරමින් පවති |

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ

# 2023 වාර්ෂික සැලැස්මේ ප්‍රගතිය

**ඉහත සදහන් වාර්ෂික සැලැස්ම සදහා නිර්දේශය ලබාදෙමි/නොදෙමි.**

**...............................**

**නිර්දේශය**

**(සභා ලේකම්)**

**ඉහත සදහන් වාර්ෂික සැලැස්ම සදහා අනුමැතිය ලබාදෙමි/නොදෙමි.**

**...............................**

**අනුමැතිය**